ඉඩමට පිවිසීම -

කටුබැද්ද හන්දියේ සිට ගාල්ල - කොළඹ පාර ඔස්සේ දෙහිවල දෙසට ගොළුමඩම හන්දිය දක්වා ඉදිරියට ගමන්කර බොරුපන පාරට දකුණට හැරී කිලෝමීටර 1.6ක් ඉදිරියට ගමන් කර 9 වන හරස් මගට වමට හැරෙන්න. එම පාරේ මීටර් 200ක් ගමන් කරන විට මෙම විෂයගත දේපළ දකුණු අත පැත්තට වන්නට පිහිටා ඇත. මෙම දේපළෙහි අංක 4 සහ 4A ලෙස සඳහන් කර ඇති බැවින් පහසුවෙන් හඳුනාගත හැක.

ගෙවීමේ ක්‍රමය :- මිටිය පහත හෙළීමෙන් පසු සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අය බදු සඳහා සියයට එකයි (1%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ;
4. නොතාරිස් ගාස්තු හා ගමන් ගාස්තුව ;
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 1,500/-;
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. සියලුම ගැනුම්කරුවන් වෙන්දේසියට ප්‍රථම තම අනන්‍යතාවය තහවුරුකර ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ විදේශීය ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය.
8. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී අංක 340, ආර්.ඒ. ද මැල් මාවත,

කොළඹ 03 හි පබ්ලික් බැංකුව බර්හාඩ් හි තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

ණය ප්‍රධානි,
පබ්ලික් බැංකුව බර්හාඩ්, අංක 340,
ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03.
දුරකථන අංක : 077-7679589.

බී. එම්. ආර්. බස්නායක,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

අංක 7/2/41, 2 වන මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන අංක : 076-2387066/071-8047659.

02 - 151

මහජන බැංකුව - ආයතනික බැංකු අංශය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත
1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29(D)
වගන්තිය යටතේ විකිණීම

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 522 B දරන පිටකෝට්ටේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ රජමහා විහාර පාර, පිටකෝට්ටේ පිහිටි හිග්ගහවත්ත යන ඉඩමට බලයලත් මිනින්දෝරු සී. සී. වික්‍රමසිංහ විසින් සකස් කළ 1967.06.17 දිනැති අංක 574 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 2 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. ඉඩමේ ප්‍රමාණය පර්චස් දහඅටයි (පර්. 18) ඉඩම් කොටස හා ඒ මත පිහිටි ගොඩනැගිලි, වගාවන් සියලු දේ සමග දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 80/75 හි ලියාපදිංචිකර ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින්,

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 05 බ්‍රහස්පතින්දා පෙ.ව. 11.00ට,

දේපළ පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ වෙත පිවිසීම -:
නුගේගොඩ සිට ස්ටැන්ලි තිලකරත්න මාවතේ ජුබිලි කණුව දක්වා ගමන්කර වමට ඇති කෝට්ටේ පාරට හැරී මීටර් 350 පමණ රජමහ විහාර පාර දක්වා ගමන් කරන්න. එතැනින් දකුණු පසට ඇති එම පාරට හැරී මීටර් 200 පමණ ගමන්කර වමට ඇති පන්සල දක්වා දිවෙන මාර්ගයේ මීටර් 125ක් පමණ ගමන්කර වමට ඇති පුබුදු මාවතට හැරී මීටර් 100ක් පමණ ගමන් කළ විට වංගුවේ වම් පසින් අදාළ දේපළ පිහිටා ඇත. රජමහ විහාර පාර ඔස්සේ අදාළ දේපළට පිවිසිය හැකිය. වාහන ගමන් කළ හැකි ප්‍රවේශ මාර්ගයක් ඇත.

තීරණය පිළිබඳ දැන්වීම -: 2025 අගෝස්තු මස 15 දින පළකරන ලද රජයේ *ගැසට් පත්‍රය* සහ ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් යන පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය -: මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් (සියයට එකක) විකුණුම් බදු ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% (සියයට දෙකහමාරක්) සහ කොමිස් මුදලට අදාළ සියලුම බදු ;
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500/- ;
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් නම් එම ගෙවීම්;
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු;

ගැනුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සහකාර සාමාන්‍යාධිකාරි (අයකරගැනීම්), මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, 12 වන මහල, අංක 374, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02 වෙත ගෙවිය යුතු වේ.
දුරකථන අංක : 011-3740740 (1215)

ඔප්පුව පිළිබඳ සහ අනෙකුත් විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10%ක මුදලක් බැංකුව සන්තක

කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය."

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 134ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

ප්‍රධාන කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය,
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක :- 081-2227593.
දුරකථන/ෆැක්ස් අංක :- 081-2224371.
ඊමේල් :- info@samera1892.com

නගර කාර්යාලය
අංක 6A, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08.
දුරකථන අංක :- 011 2671467, 011 2671468.
දුරකථන/ෆැක්ස් අංක :- 011 2671469.
ඊමේල් :- schokman@samera1892.com
වෙබ් අඩවිය :- www.sandslanka.com

02-109

HNB 100 - 2026

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - පානදුර ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී. හි වාසියට පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී.වී.එන්.ඩබ්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද 2018.07.06 දිනැති අංක 6013 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීම ගල්කිස්ස සීමාලගේ ඥානරත්න යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ,

වර්ෂ 2026 මාර්තු මස 20 දින පෙ.ව. 10.00 ට

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබද්දේ, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 680 - බෙක්කේගම ග්‍රාම නිලධාරි වසම තුළ බෙක්කේගම පිහිටි ''කහටගහවත්තේ කට්ටිය'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. කරුණාරත්න කොස්තා විසින් සාදන ලද අංක 4960 වඩාත් නිවැරදිව 4690 සහ 2013 දෙසැම්බර් 28 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 1ඒ වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : වලාන සිට හිරන දක්වා මහ පාර ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එල්. ඩබ්. එල්. ද සිල්වා විසින් සාදන ලද අංක 1293 හා 1976 නොවැම්බර් 22 දින දරන පිඹුරේ ලොට් ඩී2 (පාර) ද, දකුණට : අංක 4690 දරන එකී පිඹුරේ ලොට් 1බී සහ බස්නාහිරට : අංක 9778 දරන පිඹුරේ ලොට් සී ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම පහයි බිංදුවක් (පර්. 16.50) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සෑම සියලු දේ ද වේ.

බලයලත් මිනින්දෝරු එල්. ඩබ්. එල්. ද සිල්වා විසින් සාදන ලද අංක 1293 සහ 1976 නොවැම්බර් 22 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් ඩී2 වශයෙන් ලකුණු කරන ලද මාර්ගය සඳහා වෙන් කිරීම මතින් වන මාර්ග අයිතිය ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා -:
2024.03.15 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2024.04.254 දින මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

දේපළට පිවිසීම :
පානදුර ඔරලෝසු කණුවේ සිට කොළඹ මාර්ගයේ කිලෝමීටර් 1 1/4ක් පමණ පානදුර වලාන වටරවුම දක්වා ගමන් කර දකුණට හැරී කොළඹ පැරණි පාරට පිවිසෙන්න. ඉන්පසු මීටර් 100ක් පමණ දුර ගමන්කර බෙත්කේගම ඉඳිගහතොටුපල මාර්ගයේ දකුණට හැරෙන්න. මෙය බස් මාර්ගයකි. ඉන්පසු මීටර් 850ක් පමණ ගමන් කළ පසු දේපළට ළඟා විය හැක. අදාළ දේපළ දකුණු පසින් පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය : වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැනුම් මුදලින් සියයට දහය (10%)ක් ද ;
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලික් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද ;
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000/-)ක් ද ;
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500/-) ක් ද ;
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැනුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී.වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවිවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා -

ජ්‍යෙෂ්ඨ කළමනාකාර - ණය අධීක්ෂණ සහ අය කිරීම්,
හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී.,
අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.
දුරකථන : 011 - 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත,
පටුවත, දොඩන්දූව.
දුරකථන අංක : 071 3358434, 077 9663420.
ඊමේල් : ejayawardhana77@gmail.com

02 - 144

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - නෙළුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී.කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

උපලේඛනය

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුව හි යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත යක්කලමුල්ල ප්‍රාදේශීය සභා සීමා ඇතුළත 183B-තල්ගම්පොල උතුර ග්‍රාමනිලධාරි කොට්ඨාසය ඇතුළත තල්ගම්පොල පිහිටි "ගෙම්මේගල්ගොඩවත්ත හෙවත් ගල්ගොඩ ගෙම්මේවත්ත" හි ලොට් C හි ලොට් C1 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. බී. එස්. බන්දුල සිල්වා විසින් 2013 මාර්තු මස 09 වැනි දින පිළියෙල කරන ලද අංක 22/2013 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් C1A වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණය අක්කර එකයි, රූඩ් දෙකයි, පර්චස් දහනවයි දශම හතයි හයක (අ. 1, රූ. 2, පර්. 19.76) හෙවත් හෙක්ටයාර් 0.65701 ක විශාලත්වයෙන් වූ ඉඩම සමග, ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සමග "ලකී ටී (ප්‍රයිවට්) ලිමිටඩ්" ලෙස නම් කොට හඳුන්වනු ලැබූ තේ කර්මාන්තශාලාව ඇතුළත් එහි පිහිටි සවිකුරුව, මෙවලම්, යන්ත්‍රෝපකරණ සියල්ල සමග) සහ උපලේඛනයේ විස්තර කරන ලද සවිකරන ලද යන්ත්‍රෝපකරණ සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

2. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුව හි යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත යක්කලමුල්ල ප්‍රාදේශීය සභා සීමා ඇතුළත 183B-තල්ගම්පොල උතුර ග්‍රාමනිලධාරි කොට්ඨාසය ඇතුළත තල්ගම්පොල පිහිටි "ගෙම්මේගල්ගොඩවත්ත හෙවත් ගල්ගොඩ ගෙම්මේවත්ත" හි ලොට් C හි ලොට් C1 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. බී. එස්. බන්දුල සිල්වා විසින් 2013 මාර්තු මස 09 වැනි දින පිළියෙල කරන ලද අංක 22/2013 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් C1B වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විස්සයි දශම දෙකයි හතරක (අ. 0, රූ. 1, පර්. 20.24) හෙවත් හෙක්ටයාර් 0.15237 වූ විශාල ඉඩම සමග, ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සමග ("ලකී ටී (ප්‍රයිවට්) ලිමිටඩ්" ලෙස නම් කොට හඳුන්වනු ලැබූ තේ කර්මාන්තශාලාව ඇතුළත් එහි පිහිටි සවිකුරුව, මෙවලම්, යන්ත්‍රෝපකරණ සියල්ල සමග) සහ උපලේඛනයේ විස්තර කරන ලද සවිකරන ලද යන්ත්‍රෝපකරණ සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත කී පරිදි අංක 22/2013 දරන පිඹුරේ දැක්වෙන ලොට් E මතින්, දිගේ සහ යටින් මාර්ග අයිතිය සහ අනෙකුත් පරවශ්‍යතා අයිතීන් සමග වේ.

	විස්තරය	*ප්‍රමාණය*
(01)	Colour separator with Camera	01
(02)	Colour Separator	01
(03)	Colour Separator	01
(04)	70 Troughs	05
(05)	47 Roller	01
(06)	47 Roller	01
(07)	47 Roller	01
(08)	47 Roller	01
(09)	Roll Breaker	04
(10)	Extractor Fan	05
(11)	Winnower	02
(12)	Panel Board & Wiring System	Item
(13)	4 Feet Three Stage Dryer	01

	විස්තරය	*ප්‍රමාණය*
(14)	Generator	02
(15)	Weather Leaf Shifter	01
(16)	Complete Conveyor System from weather area to rollers 22 sections	Unit
(17)	Fiber Mat	02
(18)	Middleton	01
(19)	Chota Shifter	01
(20)	Michi Shifter	11
(21)	3T Electric Stalk Exactor	01
(22)	Packer	01
(23)	Dust Fan	04

සමාගම් නීතිය යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන තල්ගම්පොල, ගල්ගොඩදෙණිය පාරේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ලකී ටී (ප්‍රයිවට්) ලිමිටඩ් (ලියාපදිංචි කිරීමේ අංකය PV 65595 දරන) ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනවල සඳහන් දේපළ,

ලොට් C1A

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 18 දින ප.ව. 01.30 ට ද,

ලොට් C1B

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 18 දින ප.ව. 01.45 ට ද,

යන්ත්‍රෝපකරණ

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 18 දින ප.ව. 02.00 ට ද,

ඉහත ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති සඳහා :-
2021.04.23 දින රජයේ ගැසට් පත්‍රය ද, 2021.04.23 දින දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

දේපළ වලට පිවිසීම -
ගාල්ල සිට උඩුගම මහජන ප්‍රධාන පාරේ කිලෝමීටර් 12.5ක් පමණ ගමන් කර ගල්ගොඩැල්ල සුළු ප්‍රධාන පාරට දකුණට හැරී (ටී රිසර්ව් ආයතන ගේට්ටුවට මීටර් 100ක් පමණ කලින්) පාරේ දෙපස පිහිටි දේපළ වෙත ළඟා වීමට මීටර් 800ක් ගමන් කරන්න.

ගෙවීමේ ක්‍රමය :-
විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අය බදු සඳහා සියයට එකයි (1%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ;
4. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 2,000/-;
5. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
6. ගැනුම්කරු විසින් අකාලික වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුය;
7. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ නෙළුව ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.,
"ඈපා ගොඩනැගිල්ල",
පැලවත්ත පාර, නෙළුව.
දුරකථන අංක : 091-2285172.
ෆැක්ස් : 0912285030.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 7/1/10,
1 වන මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන අංක : 011 2396520.

02 - 165

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. -
බියගම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ කපුගොඩ, පූගොඩ පාරේ, අංක 106/2 හි විදාන ආරච්චිගේ දොන් සඳුන් අසේල විදානගේ ණයකරු ලෙස කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. අයි. අල්විස් විසින් සහතික කරන ලද 2017 අගෝස්තු මස 29 දින අංක 518 දරන උකස් බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත උකස් කර ඇත.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගහබඩ පත්තුවේ, දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දොම්පේ ප්‍රාදේශීය සභා සීමාව තුළ, අංක 418 A කපුගොඩ ග්‍රාමනිලධාරි කොට්ඨාසය තුළ කපුගොඩ ගමේ පිහිටි මාවතවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එස්. අලහකෝන් විසින් සාදන ලද 2005 නොවැම්බර් මස 21 වැනි දිනැති අංක 4559 දරන සැලැස්මේ ලොට් 2A ලෙස දක්වා බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලුම දේ සමඟ එකී අංක 4559 දරන සැලැස්මට අනුව ඉඩමේ ප්‍රමාණය රූඩ් එකයි පර්චස් තුනයි දශම හතයි බිංදුවක් (රූ.01, පර්. 3.70) නොහොත් හෙක්ටයාර 0.11053ක් වේ. මෙය අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව G 227/100 යටතේ ලියාපදිංචි කර ඇත.

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව ඉහත සඳහන් දේපළ,

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 19 දින පෙ.ව. 10.00 ට ද,

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම -
බියගම නිදහස් වෙළඳ කලාප මංසන්ධියේ සිට වල්ගම දෙසට මීටර් 800ක පමණ දුරක් ගොස් වල්ගම මංසන්ධිය දක්වා පැමිණ වම්පසට ඇති දෙකටන දෙසට දිවෙන මාර්ගයට හැරී කි.මී. 4ක පමණ දුරක් ගොස් පූගොඩ මාර්ගයට පිවිස එම මාර්ගය දිගේ තවත් කි.මී. 7ක් පමණ දුරක් ගොස් ගිරිදර මංසන්දිය වෙත පිවිස වම්පසට ඇති හංවැල්ල-කිරිඳිවැල -ඌරාපොල මාර්ගයට හැරෙන්න. එම මාර්ගය දිගේ තවත් මීටර් 200ක පමණ දුරක් ගොස් දකුණුපසට ඇති කපුගොඩ මාර්ගයට හැරී මීටර් 50ක පමණ දුරක් ගියවිට "හොටෙල් කපුගොඩ" නමැති අදාළ දේපළ මාර්ගයේ වම්පසින් ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටා ඇත.

යෝජනා සම්මුති සඳහා :-
රජයේ ගැසට් පත්‍රයේ 2023.04.06 දින පළවී ඇති අතර, ලංකාදීප, ඩේලිමිරර් සහ තිනකුරල් යන පුවත්පත් වල 2023.04.03 දින පළවී ඇත.

ගෙවීමේ ක්‍රමය :-
සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) ;
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000/-;
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 3,000/- ;
6. සියලුම ප්‍රචාරක වියදම් ;
7. ගැනුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි වූ දින සිට දින 30ක් ඇතුළත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩි විස්තර සඳහා විමසන්න :-
කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.,
අංක 536/30,
වල්ගම, මල්වාන, බියගම.
දුරකථන අංක : 011 2487401, 011 2487402.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

එම්. එච්. ටී. කරුණාරත්න,
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දු.ක. : 011- 3068185, 011- 2572940.

02 - 156

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ විකිණීමේ නිවේදනය

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව සිංහාරමුල්ල, කැළණිය පදිංචි (ණය ගැනුම්කරු වන) ජනක ප්‍රසන්න හේවගේ යන අය ණයකරු/උකස්කරු වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යසාරා ගයනි කස්තුරුආරච්චි විසින් සහතික කරන ලද 2018.08.01 දින අංක 12 දරන අකස් බැඳුම්කරය මගින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.(බැංකුව) වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් සුරක්ෂිත කර ඇති පහත විස්තර වන දේපළ,

2026 ක් වූ මාර්තු මස 13 දින පෙ.ව. 10.00 ට,

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉතා වටිනා දේපළක් බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, අංක 271A සපුගස්කන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාකොළ උතුර ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, "ගලබොඩවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එල්. එන්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2003 මැයි මස 05 දින අංක 1531 දරන පිඹුරේ ලොට් B1 ලෙස ලකුණුකර නිරූපණයකර ඇත්තාවූ ද (බලයලත් මිනින්දෝරු කේ. ඩබ්. ඩී. චන්ද්‍රානි විසින් 2018.07.20 දින මායිම් තහවුරුකර ඇත්තා වූ ද), බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ ඒ මත වූ වෙනත් සියලු දේ ද වේ. **ඉඩමේ ප්‍රමාණය - පර්චස් 22.22**

මෙය ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ C636/219 දරන වෙලුම/පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇත. අඩි 8ක් පළල පාර ඔස්සේ සහ ඒ හරහා යෑම ඒමේ අයිතිය ද සමග වේ.

තව ද, උපකරණ සමග විදුලි සැපයුම් පද්ධතිය, ජල සැපයුම් පද්ධති, විදුලි සංදේශ උපකරණය සහ වායු සමීකරණ උපකරණ ඇතුළු ඉහත සවිස්තරාත්මකව විස්තරකර ඇති ඉඩම් කොටසට දැනට හෝ මෙහි මින්මතු කලින් කලට එකතු කරනු ලැබිය හැකි හෝ ස්ථිරව සවිකරනු ලැබිය හැකි වූ එක්ව හා වෙන් වෙන් වශයෙන් වූ සියලු නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපකරණ, සවිකුරු, සවිකිරීම් සහ වෙනත් සේවාවන්ද ඊට ඇතුළත් වේ.

දේපළට පිවිසීම :-
කිරිබත්ගොඩ කඩමණ්ඩිය පිහිටි හන්දියේ සිට මාකොල පාරේ කිලෝමීටර් 2.7ක් පමණ ගමන්කර එතැනින් දකුණට ඇති සිරිමංගල පාරට හැරී මීටර් 500ක් ගමන්කර එතැනින් වමට ඇති අඩි 8 - 9 පළල පුද්ගලික පාරට (3 වන පටුමගට විරුද්ධව දෙසින් ඇති) පිවිස මීටර් 30ක් පමණ ගමන් කළ විට මෙම පාර අවසානයේ අදාළ දේපළ පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා :-
2024.05.03 දින *රජයේ ගැසට්* පත්‍රය ද, 2024.02.26 දින දිවයින, ද අයිලන්ඩ් හා 2024.02.22 තිනක්කුරල් යන පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය :-
මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) ;
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ;
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 3,000/-;
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000/-,

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුය. එකී 90% ක් වූ ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා විමසන්න :-
කළමනාකරු මධ්‍යගත (අයකිරීම් අංශය),
නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.,
අංක 40, නවම් මාවත,
කොළඹ 02.
දුරකථන අංක : 011 2448448

පූර්ව දැනුම් දීමකින් තොරව ඉහත වෙන්දේසි විකිණීම අත්හිටුවීමට/අවලංගු කිරීමට බැංකුවට අයිතිය ඇත.

එන්. යූ. ජයසූරිය,
වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්.

අංක 369/1,
දුටුගැමුණු මාවත,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 081-2210595,
ජංගම - 077-3067360, 077-6447848.

0 2- 147

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ විකිණීමේ නිවේදනය

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව සිංහාරමුල්ල, කැලණිය පදිංචි (පළමු ණය ගැනුම්කරු වන) ජනක ප්‍රසන්න හේවගේ සහ සිංහාරමුල්ල, කැළණිය පදිංචි (දෙවන ණය ගැනුම්කරු වන) මනෝජ් ජීවනී සෙනරත් යන අය ණයකරුවන්/උකස්කරුවන් වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යසාරා ගයනි කස්තුරුආරච්චි විසින් සහතික කරන ලද 2020.01.30 දින අංක 383 දරන උකස් බැඳුම්කරය මගින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. (බැංකුව) වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් සුරක්ෂිත කර ඇති පහත විස්තර වන දේපළ,

2026 ක් වූ මාර්තු මස 20 දින පෙ.ව. 11.30 ට,

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉතා වටිනා දේපළක් දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර මහනගර සභා සීමාව ඇතුළත මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 409B, වල්ගම උතුර ග්‍රාමනිලධාරි කොට්ඨාසය ඇතුළත, වල්ගම ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, බලයලත් මිනින්දෝරු එච්. ජේ. සමරපාල විසින් සාදන ලද 2016 ජනවාරි මස 21 දින අංක 3797 දරන මිනින්දෝරු පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණුකර නිරූපණය කර ඇති බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය - පර්චස් 16.70

මෙය මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ A840/42 දරන වෙලුම/පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී අංක 3797 දරන පිඹුරේ බටහිර මායිමේ පෙන්වා ඇති මාර්ගය ඔස්සේ යෑම ඒමේ මාර්ග පරවශතා අයිතිය සහ වෙනත් පහත සඳහන් සමාන අයිතිවාසිකම් ද සමග වේ. (මෙම ඉඩමේ ලොට් 2G1)

තව ද, උපකරණ සමග විදුලි සැපයුම් පද්ධතිය, ජල සැපයුම් පද්ධතිය, විදුලි සංදේශ උපකරණ සහ වායු සමීකරණ උපකරණ ඇතුළු ඉහත සවිස්තරාත්මව විස්තරකර ඇති ඉහත කී ඉඩම් කොටසට දැනට හෝ මෙහි මින්මතු කලින්කලට කරනු ලැබිය හැකි හෝ ස්ථිරව සවිකරනු ලැබිය හැකි වූ එක්ව සහ වෙන් වෙන් වශයෙන් වූ නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපකරණ, සවිතුරු, සවිකිරීම් ද සමග වේ.

දේපළට පිවිසීම :-

මාතර නගර මධ්‍යයේ සිට ගාලු පාරේ කිලෝමීටර් 3.8ක් පමණ ගමන්කර වල්ගම හන්දිය දක්වා පැමිණ එතැනින් දකුණට ඇති සුනන්ද පාරට හැරී මීටර් 300ක් ගමන්කර එතැනින් වමට ඇති සමගි මාවතට හැරී මීටර් 200ක් පමණ ගමන් කර එතැනින් වමට ඇති 6 වන පටුමගට හැරී මීටර් 150ක් පමණ ගමන් කළ විට, වමට ඇති අඩි 10ක් පළල පාරට හැරී මීටර් 15ක් පමණ ගමන් කළවිට මෙම පාර අවසානයේ අදාළ දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා :-
2024.03.22 දින රජයේ *ගැසට්* පත්‍රය ද, 2024.02.26 දින දිවයින, ද අයිලන්ඩ් හා 2024.02.22 තිනක්කුරල් යන පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය :-

මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) ;
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ;
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 3,000/-;
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000/-
,

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුය. එකී 90% ක් වූ ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා විමසන්න :-
කළමනාකරු මධ්‍යගත (අයකිරීම් අංශය),
නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.,
අංක 40, නවම් මාවත, කොළඹ 02.
දුරකථන අංක : 011 2448448

පූර්ව දැනුම් දීමකින් තොරව ඉහත වෙන්දේසි විකිණීම අත්හිටුවීමට/අවලංගු කිරීමට බැංකුවට අයිතිය ඇත.

එන්. යූ. ජයසූරිය,
වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්.

අංක 369/1,
දුටුගැමුණු මාවත,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 081-2210595,
ජංගම - 077-3067360, 076-6447848.

02 - 150

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - හෙට්ටිපොල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ පඩුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ දොලහමුන ග්‍රාමනිලධාරි වසම තුළ ගිරිතලාන සහ ගිරිතලාන ආචාරිගම යන ගම්වල පිහිටි ''දොලහමුන එස්ටේට්'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. බී. නවරත්න විසින් සාදන ලද අංක 5224සී සහ 2005 දෙසැම්බර් 26 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 09, ලොට් 10 වශයෙන් දැක්වෙන බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස් සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව සහ පලතුරු ඇතුළු අනෙකුත් සියලු දේ.

ලොට් 09 - ඉඩමේ ප්‍රමාණය - පර්චස් 16.5
ලොට් 10 - ඉඩමේ ප්‍රමාණය - පර්චස් 15

තව ද ඉහත විස්තරවන අංක 5224සී දරන පිඹුරේ ලොට් 11 වශයෙන් ලකුණු කර ඇති මාර්ගය පාවිච්චි කිරීමට ඇති අයිතිය ද සමග වේ.

මෙම දේපළ මාරසිංහ ආරච්චිලාගේ සුනිල් ධර්මදාස (නැසීගිය) යන අය ණයකරු වශයෙන් හා උකස්කරු වශයෙන් කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් හෙක්ටර් එස්. පී. පෙරේරා විසින් ලියා සහතික කරන ලද 2012.10.15 දිනැති අංක 12945 දරන සහ කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. ආර්. පී. ගාල්ලගේ විසින් දෙකම ලියා සහතික කරන ලද 2013.07.26 දිනැති අංක 2092 සහ 2017.07.14 දිනැති අංක 3613 දරන සහ කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් හෙක්ටර් එස්. පී. පෙරේරා විසින් ලියා සහතික කරන ලද 2018.02.09 දිනැති අංක 15986 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් සුරක්ෂිත කර ඇති ඉහත විස්තර කරන ලද දේපළ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව,

වර්ෂ 2026 මාර්තු මස 30 දින පෙ.ව. 11.30 ට

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම :-

හෙට්ටිපොල ප්‍රධාන බස් නැවතුම්පොලේ සිට හලාවත පාර ඔස්සේ මීටර් 250ක් පමණ ගමන් කර එතැනින් දකුණට ඇති දොලහමුන 2 වන පටුමගට පිවිස එම පාරේ මීටර් 300ක් පමණ ගමන්කළ විට වංගුවට මෙපිටින් මෙම පාරට මුහුණලා වම් පසින් ලොට් 10 කොටස පිහිටා තිබේ. ලොට් 9 කොටස ලොට් 10ට පිටුපසින් අතුරු පාරට මුහුලා පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා :-

2024.03.07 දින දරන රජයේ *ගැසට්* පත්‍රය ද, 2024.03.11 දින මව්බිම, ඩේලිමිරර් හා තිනක්කුරල් යන පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය :-

මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) ;
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ;
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 3,000/-;
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000/- ,

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙනොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුය.

තිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා -
ජ්‍යෙෂ්ඨ කළමනාකාර - වාණිජ අයකිරීම් අංශය,
හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී.,
අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.
දුරකතන 011 - 2661835, 2661836.

එන්. යූ. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1,
දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 081-2210595,
ජංගම - 077-3067360, 076-1375993.

02 - 149

අමානා බැන්ක් පී.එල්.සී. - මහනුවර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වගන්තිය යටතේ විකිණීමේ දැන්වීමයි

අමානා බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව කාලි මුදියන්සේලාගේ මොහොමඩ් ඉස්මායිල් මොහොමඩ් රෆීක් *හෙවත්* මොහොමඩ් සහීඩ් හෙවත් කාලී මුදියන්සේලාගේ ගෙදර සහීඩ් මොහොමඩ් රෆීක් යන අය කාදි මුදියන්සේලාගේ ෂහීඩ් මොහොමඩ් රෆීක් රුෂාන් ෂාබික් යන අය විසින්, කාදී මුදියන්සේලාගේ ෂහීඩ් මොහොමඩ් රෆීක් රුශ්ඩි ශහීඩ් සහ කාදි මුදියන්සේලාගේ ෂහීඩ් මොහොමඩ් රෆීක් රුස්ලි සාද් *හෙවත්* කාදි මුදියන්සේලාගේ ෂහීඩ් රෆීක් රුෂ්ලි සාද් හෙවත් කාදි මුදියන්සේලාගේ ෂහීඩ් රෆීක් රුෂ්ලි සාද් යන අය බන්ධනදායී වශයෙන් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. ඉඩ්ඩෘස් විසින් ලියා සහතික කරන ලද 2021 පෙබරවාරි මස 19 දින අංක 1505 දරන උකස් බැඳුම්කරය මගින් අමානා බැන්ක් පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇති පහත විස්තර වන දේපළ,

වර්ෂ 2026 මාර්තු මස 26 දින පෙ.ව. 10.00 ට

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පල්ලේගම්පහ හාරිස්පත්තුවේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පූජාපිටිය ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත මුල්ලේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මුල්ලේගම ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, ''දේවාලතැන්න උයන්වත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා සහ ඒ හා සම්බන්ධයෙන් බලයලත් මිනින්දෝරු ඒ. බී. වීරසේකර විසින් සාදන ලද 1971 ජුනි මස 26 දින අංක 1239 දරන පිඹුරේ ලොට් අංක 7 සහ 8 දරන බෙදා වෙන් කරන ලද යාබද ඉඩම් කොටස් දෙක සහ එම ඒකාබද්ධ ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ අනෙකුත් සියලු දේ ද වේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 33

මෙය මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ U123/85 දරන වෙළුම/පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී ඉඩම් කොටස නැවත මැන පහත දැක්වෙන පරිදි නිරූපණය කර ඇත;

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පල්ලේගම්පහ කෝරළේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පූජාපිටිය ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත උඩහමුල්ලේගම ග්‍රාමනිලධාරි කොට්ඨාසයේ, මුල්ලේගම ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, ''දේවාලතැන්න උයන්වත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා සහ ඒ හා සම්බන්ධයෙන් බලයලත් මිනින්දෝරු ඒ.එම්. තිලකරත්න විසින් සාදන ලද 2020 සැප්තැම්බර් මස 12 වැනි දින අංක 2056 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කර නිරූපණය කර ඇති , (බලයලත් මිනින්දෝරු ඒ. බී. වීරසේකර විසින් සාදන ලද 1971 ජුනි මස 26 දින අංක 1239 දරන පිඹුරේ ලොට් අංක 7 සහ 8 දරන කොටස්වල නැවත මැනීමක් වන) බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් ඇතුළු වෙනත් සියලු දේද වේ. ඉඩමේ ප්‍රමාණය - පර්චස් 33

දේපළට පිවිසීම :-
මහනුවර නගරයේ සිට මාතලේ පාර ඔස්සේ කිලෝමීටර 7.4 පමණ ගමන්කර අඹතැන්න හන්දිය දක්වා පැමිණ එතැනින් වමට හැරී පූජාපිටිය පාර ඔස්සේ මීටර් 300ක් පමණ ගමන් කර මුල්ලේගම පාර දක්වා පැමිණි විට මෙම පාරේ වම් පසින් අදාළ දේපළ පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා :-
2024.01.26 දින දරන රජයේ *ගැසට්* පත්‍රය ද, 2024.01.26 දින දිවයින, ඩේලිමිරර් හා තිනක්කුරල් යන පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය :-
මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු සහ වෙනත් ගාස්තු ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) ;
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය සහ අනෙකුත් ගාස්තු ;
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 3,000/-;
6. විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000/-,

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුය.

එකී 90% ක් වූ ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවිවහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාළ සහ වැඩි විස්තර සඳහා -
අයකිරීම් කළමනාකරණ ප්‍රධානි - අමානා බැන්ක් පීඑල්සී,
අංක 486, ගාලු පාර,
කොළඹ 03.
දුරකථන අංක :- 0112 7756000
දිගුව - 2112

පූර්ව දැනුම්දීමකින් තොරව ඉහත වෙන්දේසි විකිණීම අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට බැංකුවට අයිතිය ඇත..

එන්. යූ. ජයසූරිය,
වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්.
අංක 369/1,
දුටුගැමුණු මාවත,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 081-2210595,
ජංගම - 077-3067360, 076-6447848.

02 - 148

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - මොණරාගල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී.කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර

පළමු උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ, වැදිරට කෝරළයේ, බුත්තල මුප්පනේ ගමේ පිහිටි කුමාරදොළ පාරේ, වරිපනම් අක 78 සහ 80 දරන "එගොඩවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් 1997 මාර්තු මස 25 දින පිළියෙල කරන ලද අංක 960 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස.

ප්‍රමාණය පර්චස් බිංදුවයි පහයි දශම බිංදුවයි අට (පර්. 05.08) විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

දෙවන උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැදිරට කෝරළයේ, බුත්තල මුප්පනේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මුප්පනේ ගමේ පිහිටි "බකිණිකොටහේන" ලෙස නම්කොට හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් 2008.02.09 දින පිළියෙල කරන ලද අංක 3171 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස,
ප්‍රමාණය පර්චස් පහළොව (පර්. 15) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි අටයි නවය (0.0389) ක

විශාලත්වයෙන් වූ ඉඩම සමග එහි පිහිටි සියලු දේත් සමග සහ එකී ඉඩමේ නිරිතදිග සීමාව ඔස්සේ පිහිටි අඩි 12 පළල පොදු ප්‍රදේශය භාවිතයට ඇති අයිතිය සමග වේ.

නිව් මොණරාගල ෆාමසි යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යන කිරිකංකානම්ගේ දමිත් ශානක පෙරේරා සහ හපුහෙන්නදිගේ අසංක ලක්මාලි ප්‍රනාන්දු ණයකරුවන් සහ කිරිකංකානම්ගේ දමිත් ශානක පෙරේරා උකස්කරු හැටියට මෙහි 1 වන සහ 2 වන උපලේඛනවල සඳහක් දේපළ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කර ඇත.

තව ද, කිරිකංකානම්ගේ දමිත් ශානක පෙරේරා ණයකරු හැටියට මෙහි 1 වන උපලේඛනයේ සඳහන් දේපළ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කර ඇත.

1 වන උපලේඛනය - ලොට් 1

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 16 දින පෙ.ව. 10.30ට ද,

2 වන උපලේඛනය - ලොට් අංක 1

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 16 දින පෙ.ව. 11.30ට ද,

ඉහත ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති සඳහා :-

2021.04.23 දින රජයේ *ගැසට් පත්‍රය* ද, දිවයින, ඩේලිනිව්ස් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.
දේපළ වලට පිවිසීම -

1 උපලේඛනය

මොණරාගල ප්‍රධාන ඔරලෝසු කණුවේ සිට ප්‍රධාන පාර ඔස්සේ මීටර් 100ක පමණ දුරක් ගමන් කළ විට පාර ඉදිරිපිට දකුණු අත පැත්තේ පිහිටි විෂයගත දේපළ වෙත ළඟාවිය හැක. (මොණරාගල ෆාමසි)

2 උපලේඛනය

මොණරාගල නගරයේ සිට බිබිල පාර ඔස්සේ මීටර් 750ක පමණ දුරක් ගමන් කළ විට ප්‍රාදේශීය සභා කාර්යාලයට විරුද්ධව දකුණු පැත්තේ කොන්ක්‍රීට් කරන ලද සහ බොරළු පාරට ළඟා වේ. මෙම පාර ඔස්සේ මීටර් 125ක පමණ දුරක් ගමන් කළ විට පාර ඉදිරිපිට දකුණු අත පැත්තේ පිහිටි විෂයගත දේපළ වෙත ළඟා විය හැක.

ගෙවීමේ ක්‍රමය :-
විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අය බදු සඳහා සියයට එකයි (1%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ;
4. නොතාරිස් ගාස්තුව රු. 2,000යි ;
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු.500/-;
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැනුම්කරු විසින් එකොළහයි වට්නාකම් බද්ද (VAT) ගෙවිය යුතුය;
8. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ මොණරාගල ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.,
අංක 94/5, කුමාරදොල පාර,
මොණරාගල.
දුරකථන අංක : 055 2277321
ෆැක්ස් : 055 2277324.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 7/1/10,
1 මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන අංක : 011 - 2396520.

02 - 167

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. -
මොණරාගල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී.කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පළමු උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ, වැදිරට කෝරළයේ, බුත්තල මුප්පනේ ගමේ පිහිටි කුමාරදොළ පාරේ, වරිපනම් අංක 78 සහ 80 දරන "එගොඩවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් 1997 මාර්තු මස 25 දින පිළියෙල කරන ලද අංක 960 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස,
ප්‍රමාණය පර්චස් බිංදුවයි පහයි දශම අට (පර්. 05.08)

විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

තව ද, කිරිකංකානම්ගේ දමිත් ශානක පෙරේරා ණයකරු හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ.

1 උපලේඛනය - ලොට් 1

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 16 දින පෙ.ව. 10.30ට ද,

ඉහත ස්ථානයේ මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති සඳහා :-

2021.04.23 දින රජයේ *ගැසට් පත්‍රය* ද, දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

දේපළට පිවිසීම :-

1 උපලේඛනය - ලොට් 1

මොණරාගල ප්‍රධාන ඔරලෝසු කණුවේ සිට ප්‍රධාන පාර ඔස්සේ මීටර් 100ක පමණ දුරක් ගමන් කළ විට පාර ඉදිරිපිට දකුණු අත පැත්තේ පිහිටි විෂයගත දේපළ වෙත ළඟාවිය හැක. (මොණරාගල ෆාමසි)

ගෙවීමේ ක්‍රමය :-

විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අය බදු සඳහා සියයට එකයි (1%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ;
4. නොතාරිස් ගාස්තුව රු. 2,000;
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු.500/-;
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැනුම්කරු විසින් එකතුකළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුය;
8. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ මොණරාගල ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.,
අංක 94/5, කුමාරදොළ පාර,
මොණරාගල.
දුරකථන අංක : 055 - 2277321
ෆැක්ස් : 055 - 2277324

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජෝෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 7/1/10,
1 මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන අංක : 011-2396520

02 - 166

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. -
වැල්ලවාය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී.කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පළමු උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය කෝරළයේ, වැල්ලවාය ප්‍රාදේශීය සභා සීමා ඇතුළත වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 151A - නුගයාය ග්‍රාම නිලධාරි

කොට්ඨාසයේ නුගයාය (F.T.P.2) ගමේ පිහිටි "නුගයාය ඉඩම" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, ඩී. එස්. ඒ. රන්ජන විසින් 2013.04.06 දින පිළියෙල කරන ලද අංක 1179 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස,

ප්‍රමාණය අක්කර එකයි, රූඩ් දෙකයි, පර්චස් හතයි දශම එකයි එක (අ. 1, රූ.2, පර්.7.11)
විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

දෙවන උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය කෝරළයේ, වැල්ලවාය ප්‍රාදේශීය සභා සීමා ඇතුළත වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 151D - නුගයාය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නුගයාය ගමේ පිහිටි "නුගයාය" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, ටී. බී. එස්. සන්ගරන්දෙනිය විසින් 2017.03.19 දින පිළියෙල කරන ලද අංක 914 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස,

ප්‍රමාණය අක්කර එකයි, පර්චස් දෙකයි දශම පහ (අ. 1, රූ.2, පර්.2.5) ක
විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

කුලසිංහ ආරච්චිගේ පියල් සහ විදාන පතිරණගේ විමලාවතී ණයකරුවන් හැටියට මෙහි 1 වන සහ 2 වන උපලේඛනවල සඳහන් දේපළ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කර ඇත.

1 උපලේඛනය - ලොට් 1

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 16 දින ප.ව. 1.00ට ද,

2 උපලේඛනය - ලොට් 1

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 16 දින ප.ව. 2.00ට ද,

ඉහත ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා :-

2021.04.23 දින රජයේ *ගැසට් පත්‍රය* ද, දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

දේපළ වලට පිවිසීම -

1 වන උපලේඛනය

වැල්ලවාය ප්‍රධාන හන්දියේ සිට හම්බන්තොට පාර ඔස්සේ 316/3 බෝක්කුව පසුකර කිලෝමීටර් 2.25ක් ගමන් කළ විට "පියල් ඔටෝ එංජිනියර්ස්" යන නාමය සහිත ප්‍රධාන පාරට අභිමුඛව වමට විෂයගත දේපළ පිහිටා ඇත.

2 වන උපලේඛනය

වැල්ලවාය නගරයේ සිට තණමල්විල පාර ඔස්සේ කිලෝමීටර් 2.25ක පමණ දුරක් ගමන් කළ විට පාර අභිමුඛව දකුණු අත පැත්තේ විෂයගත දේපළ පිහිටා ඇති අතර එය 316/3 අංක දරන බෝක්කුව ඉක්මවා මීටර් 50ක් පමණ දුරින් වේ.

ගෙවීමේ ක්‍රමය :-

විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අය බදු සඳහා සියයට එකයි (1%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ;
4. නොතාරිස් ගාස්තුව රු. 2,000/-;
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු.500/-;
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැනුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුය;
8. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ වැල්ලවාය ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.,
අංක 100, මොණරාගල පාර,
වැල්ලවාය.
දුරකථන අංක : 055 - 2274977.
ෆැක්ස් : 055 2274978.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 7/1/10,
1 මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන අංක : 011 - 2396520.

02 - 164

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - හික්කඩුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී.කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පළමු උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, අලුත්වල ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ අලුත්වල ගමේ පිහිටි ගිනිගල්කැටියේ වත්ත *හෙවත්* දෙල්ගහවත්ත නමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස.

ප්‍රමාණය පර්චස් තිස් දෙකයි දශම තුනයි එක (පර්.32.31) *හෙවත්* හෙක්ටයාර් 0.0817 ක විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, පස වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

දෙවන උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, අලුත්වල ගමේ පිහිටි ගිනිගල්කැටියේ වත්ත *හෙවත්* දෙල්ගහවත්ත නමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 02 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස.

ප්‍රමාණය පර්චස් දාහතරයි දශම පහයි බිංදුව (පර්.14.50) හෙවත් හෙක්ටයාර් 0.0367ක විශාල ඉඩම සමග ගොඩනැගිලි, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

තුන්වන උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගහබොඩපත්තුව - දකුණ හි අලුත්වල ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව හි සීමා තුළ අම්පේගම හි පිහිටි ෆ්‍රෙඩ්රූස් වත්ත *හෙවත්* ෆ්‍රෙඩ්'ස් රූ එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, කේ. ඩබ්. එස්. කේ. වික්නරාජා විසින් 2008 සැප්තැම්බර් මස 28 දින පිළියෙල කරන ලද අංක 1270 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් වශයෙන් දැක්වෙන ඉඩම් කොටස.

ප්‍රමාණය අක්කර තුන (අක්. 03) ක විශාල ඉඩම සමග ගොඩනැගිලි, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

දොඩන්දූව වඩුගේ අජිත් ණයකරු හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත උපලේඛන වල සඳහන් දේපළ,

1 උපලේඛනය

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 18 දින පෙ.ව. 9.00 ට ද,

2 උපලේඛනය

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 18 දින පෙ.ව. 9.15 ට ද,

3 උපලේඛනය

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 18 දින පෙ.ව. 10.00 ට ද,

ඉහත ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා :-

2019.12.27 දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2019.12.31 දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

දේපළ වලට පිවිසීම -

1 හා 2 උපලේඛන

හික්කඩුව සිට බද්දේගම පාර ඔස්සේ කිලෝමීටර් 5.7ක් පමණ ගමන් කර ඇල්පිටිය පාරට වමට හැරී, කිලෝමීටර් 4.1ක් පමණ ගමන් කළ විට විෂයගත දේපළ දකුණට වන්නට පිහිටා ඇත.

3 උපලේඛනය

හික්කඩුව සිට බද්දේගම පාර ඔස්සේ කිලෝමීටර් 5.7ක් පමණ ගමන් කර වමට හැරී, ඇල්පිටිය පාර ඔස්සේ ගමන් කර, අලුත්වල හන්දිය පසුකර, තවදුරටත් ඉදිරියට මීටර් 350ක් පමණ ගමන් කළ විට විෂයගත දේපළ වමට වන්නට පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය :-

විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අය බදු සඳහා සියයට එකයි (1%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ;
4. නොතාරිස් ගාස්තුව රු. 2,000/- ;
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු.500/-;
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැනුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුය;
8. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ හික්කඩුව ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.,
අංක 217, ගාලු පාර, හික්කඩුව.
දුරකථන අංක : 091-2277398.
ෆැක්ස් : 091-2276533.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 7/1/10, 1 වන මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන අංක : 011 - 2396520.

02 - 163

සෙලාන් බැංකුව පීඑල්සී - බණ්ඩාරවෙල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

ප්‍රසිද්ධ නොතාරිස් රේණුකා උඩුවන විසින් තුනම සහතික කරන ලද ඉන් දෙකක් 2018 පෙබරවාරි මස 08 දිනැති බැඳුම්කර අංක 618 සහ 619 සහ 2018 ජූනි මස 25 දිනැති අංක 648 දරන උකස්කරයන් මත අයවිය යුතු මුදල් ගෙවීම බණ්ඩාරවෙල පදිංචි හේරත් මුදියන්සේලාගේ නාලක සංජීව වන්දිමාල් ගුණරත්න යන අය බන්ධනදායී/උකස්කරු වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහපලාත කෝරළේ, වැවතැන්න 116සී ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මැටිපිම්බිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු විමල් රාජරත්න විසින් සාදන ලද 2018 ජනවාරි මස 24 දිනැති අංක 4808 දරන සැලැස්මේ නිරූපනය වන ලොට් 1 ලෙස ලකුණු කළ වැවතැන්න පතන නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් තිස් අටක් (පර්. 38) *නොහොත්* හෙක්ටයාර් 0.096 ක් විශාල ගොඩනැගිල්ල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම වේ. ඉහත සඳහන් දේපළ,

2026 මාර්තු මස 12 දින පෙ.ව. 9.30ට

සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03 දරන ස්ථානයේ දී (පාරිභෝගික රථගාලේ) මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම :-
බණ්ඩාරවෙල නගරයේ සිට වැලිමඩ පාර ඔස්සේ මීටර් 600ක පමණ දුරක් ගොස් බණ්ඩාරවෙල මහජන ක්‍රීඩාංගනය දක්වා පැමිණ දකුණු පසට ඇති ඇටම්පිටිය පාරට හැරී තවත් කි.මී. 1.4ක පමණ දුරක් ගොස්, පාසැල් මාවත දක්වා පැමිණ වම් පසට ඇති පාසැල් මාවතට හැරී, තවත් මීටර් 550ක පමණ දුරක් ගියවිට දකුණු පසින් අඩි 15ක් පළල ඇති මාර්ගය හමුවේ. එම මාර්ගයට හැරී මීටර් 180ක පමණ දුරක් යන විට හමුවන T මංසන්ධියෙන් දකුණු පසට හැරී තවත් මීටර් 20ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම : රජයේ *ගැසට් පත්‍රයේ* 2019.09.12 දින පළ වී ඇති අතර, ලංකාදීප සහ ඩේලි මිරර් හා තිනක්කුරල් පුවත්පත්වල 2019.09.11 දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය : සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) ;
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000/- ;
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 2,000/- ;
6. සියලුම ප්‍රචාරක වියදම් ;
7. ගැනුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩිදුර විස්තර සඳහා විමසන්න :-
සහකාර සාමාන්‍යාධිකාරි (නීති),
සෙලාන් බැංකුව පී. එල්. සී., අංක 90,
ගාලු පාර, කොළඹ 03.
දුරකථන : 011-2456498/ 011 - 2456491.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න,
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොළොන්නාව.
දු.ක. - 011 - 3068185, 011 - 2572940

02 - 155

සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

හිරාන් පවර් පනාමුරේ (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංකය : 0043 1000 1711

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2025.06.25 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහ හතර කෝටි දාහත් ලක්ෂ තිස් දහස් හාරසිය හැත්තෑ පහයි ශත පනස් හතක (රු. 141,730,475.57) මුදල ද, 2025 අප්‍රේල් මස 07 දින සිට අංක 2950 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් කෝටි අනූ අට ලක්ෂ හැට හය දහස් හත්සිය දොළහක (රු. 79,866,712.00) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Two Decimal Naught *per centum* (AWPLR+ 2.0% p.a.) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2025.09.19 දින *රජයේ ගැසට් පත්‍රයේ*හා 2025.09.10 දින "දිවයින", "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි,

Schedule 1 - 2026.03.16 දින, පෙ.ව. 11.00,
Schedule 2 - 2026.03.16 දින, පෙ.ව. 01.00,

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

1. (*a*) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ කැළණිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ තලවතුහේන්පිට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දළුගම උප කාර්යාල සීමාවන් තුළ තලවතුහේන්පිට පිහිටි "කලමඩුවගහකුඹුර" යයි කියනු ලබන කුඹුරට (බලයලත් මානක තැන රත්න හෙට්ටිආරච්චි විසින් සාදන ලද 1983 පෙබරවාරි මස 06 දාතම හා අංක 25/1983 දරන පිඹුරේ නිරූපිත කුඹුරේ කොටසක් වන) බලයලත් මානක තැන පී. ජයකොඩි යන අය විසින් සාදන ලද 2005 නොවැම්බර් මස 23 දාතම හා අංක 6040 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : නුවර පාර සහ ලොට් B; නැගෙනහිරට : ලොට් B; දකුණට : ලොට් C සහ බස්නාහිරට : ඇළ සහ නුවර පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (P:10) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 6040 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 123/121 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(*b*) එකී තලවතුහේන්පිට පිහිටි "කලමඩුවගහකුඹුර" යයි කියනු ලබන කුඹුරට (බලයලත් මානක තැන රත්න හෙට්ටිආරච්චි විසින් සාදන ලද 1983 පෙබරවාරි මස 06 දාතම හා අංක 25/1983 දරන පිඹුරේ නිරූපිත කුඹුරේ කොටසක්වන) බලයලත් මානක තැන පී. ජයකොඩි යන අය විසින් සාදන ලද 2005 නොවැම්බර් මස 23 දාතම හා අංක 6040 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : නුවර පාර සහ අංක 106/1980 දරන පිඹුරේ ලොට් D හි ඉතිරි කොටස; නැගෙනහිරට : අංක 106/1980 දරන පිඹුරේ ලොට් D හි ඉතිරි කොටස, එන්. ඩී. සීලවති හාමිනේට අයිති කුඹුර සහ ලොට් C; දකුණට : එන්. ඩී. සීලවති හාමිනේට අයිති කුඹුර සහ ලොට් C සහ ලොට් A සහ බස්නාහිරට : ලොට් A සහ නුවර පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (R:1) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 6040 දරන පිඹුරට අනුව වෙළුම/ පත්ඉරුව G 123/122 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(*c*) එකී තලවතුහේන්පිට පිහිටි "කලමඩුවගහකුඹුර" යයි කියනු ලබන කුඹුරට (රත්න හෙට්ටිආරච්චි විසින් සාදන ලද 1983 පෙබරවාරි 06 දාතම හා අංක 25/1983 දරන පිඹුරේ නිරූපිත කුඹුරේ කොටසක්වන) බලයලත් මානක තැන පී. ජයකොඩි යන අය විසින් සාදන ලද 2005 නොවැම්බර් මස 23 දාතම හා අංක 6040 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් C වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් A සහ ලොට් B සහ ඊ. ඒ. ඒ. එදිරිසිංහට අයිති කුඹුර; නැගෙනහිරට : එන්. ඩී. සීලවතී හාමිනේට සහ ඊ. ඒ. ඒ. එදිරිසිංහට අයිති කුඹුරු, ඇළ සහ පන්සලට අයිති ඉඩම; දකුණට : කුඹුර (T P 207358) සහ ඇළ සහ බස්නාහිරට : ඇළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විසි පහක් (A:1, R:3, P:25) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ,

වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 6040 දරන පිඹුරට අනුව වෙළුම/ පත්ඉරුව G 123/123 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ හැව්ලොක් ටවුන් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හැව්ලොක් ටවුන්, වෝඩ් අංක 5 පිහිටි තිඹිරිගස්යාය පාර, වරිපනම් අංක 140 දරන ඉඩමට බලයලත් මානක තැන එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සාදන ලද 2004 ජනවාරි මස 21 දාතම හා අංක 2785 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : තිඹිරිගස්යාය පාර; නැගෙනහිරට : අඩි පාර; දකුණට : තිඹිරිගස්යාය පාර, වරිපනම් අංක 142/33 සහ 138 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : පුද්ගලික පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හයයි දශම පහයි බිංදුවක් (P:26.50) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2785 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව E 216/97 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 2785 දරන එකී පිඹුරේ එකී ලොට් 01 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ හැව්ලොක් ටවුන් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හැව්ලොක් ටවුන්, වෝඩ් අංක 5 පිහිටි තිඹිරිගස්යාය පාර, වරිපනම් අංක 140 දරන ඉඩමට බලයලත් මානක තැන ඒ. ආර්. ඩයස් අබයගුණවර්ධන විසින් සාදන ලද 1979 මාර්තු මස 27 දාතම හා අංක 2794 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : තිඹිරිගස්යාය පාර; නැගෙනහිරට: අඩි පාර; දකුණට : තිඹිරිගස්යාය පාර, වරිපනම් අංක 142/33 සහ 138 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : පුද්ගලික පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හයයි දශම පහයි බිංදුවක් (P: 26.50) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2794 දරන පිඹුරට අනුව ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 174

සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩබ්ලිව්. ජී. ජී. ඥාණවර්ධන
ගිණුම් අංකය : 0167 5000 0669

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.02.23 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දෙකෝටි හය ලක්ෂ දාහත් දහස් එකසිය දහ තුනයි ශත විසි නවයක (රු. 20,617,113.29) මුදලද, 2023 ජනවාරි 11 දින සිට අංක 2571, 397, 868 සහ 3003 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි විසි අට ලක්ෂ දහ නව දහස් හාරසියයක (රු. 12,819,400.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට අටක් (8%) හා තවත් රුපියල් හැට අට ලක්ෂ අසූ තුන් දහස් තුන්සියයක (රු. 6,883,300.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට අටක් (8%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ ගාස්තුද, වෙනත් තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.05.26 දින *රජයේ ගැසට් පත්‍රයේ*හා 2023.05.24 දින "දිවයින", "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි,

2026.03.23 දින පෙ.ව. 11.00 ට,

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ පිහිටි වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ (බ්ලොක් 405 පද්ධතිය "C") පිහිටිවැව ග්‍රාමයේ පිහිටි "පිහිටිවැවයාය" යැයි කයනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච් එම් චන්ද්‍රරත්න යන අය විසින් සාදන ලද 2011 දෙසැම්බර් 17 (වඩා නිවැරදිව) දාතම හා අංක 1627 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : F C P Po. 405 හි ලොට් 158 (වඩා නිවැරදිව) නැගෙනහිරට : F C P Po. 405 හිලොට් 182 (පාර) (වඩා නිවැරදිව) දකුණට : F C P Po. 405 හි ලොට් 135

(පාර) (වඩා නිවැරදිව) සහ බස්නාහිරට : F C P Po. 405 හි ලොට් 136 (වඩා නිවැරදිව) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි අටයි දශම හතරයි බිංදුවක් (පර්. 28.40) හෝ හෙක්ටයාර 0.173 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1627 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව LDO J 36/73 (වෙනත් විස්තර තිරුව) යටතේ පොලොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී (බ්ලොක් 405 පද්ධතිය "C") පිහිටිවැව ග්‍රාමයේ පිහිටි "පිහිටිවැවයාය"යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජනරාල් විසින් සාදන ලද අංක F C P Po. 405(අතිරේක අංක 01 හි ෂීට් අංක 01) හි නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 159 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 158 (වඩා නිවැරදිව) නැගෙනහිරට : ලොට් 182 (වඩා නිවැරදිව) දකුණට : ලොට් 135 (වඩා නිවැරදිව) සහ බස්නාහිරට : ලොට් 136 (වඩා නිවැරදිව) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම එකයි හතයි තුනක් (හෙක්. 0.173) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක F C P Po 405 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව LDO J 36/73යටතේ පොලොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලේය ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 169

ලංකා බැංකුව

වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැනුම්දීම

1. ණය පහසුකම් යොමු අංක : 75351425,87907848,89528698 & 89528716

බත්තරමුල්ල, රොබට් ගුණවර්ධන මාවත, අංක 186හි අලි අස්ගර් ෂබ්බීර් හුසේන් අබ්බාස් මහතාගේ උකස් කරන ලද දේපළ විකිණීම

2. ලංකා බැංකු ආඥාපනතේ 19 වන වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ 2025.11.21 වන දින අංක 2464 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්පත්‍රයේ හා 2025.11.14 වන දින ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකුණනු ලබන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය එකී ස්ථානයේදී ම,

2026 මාර්තු 04 දින පෙ.ව. 10.00 ට,

කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ පල්ලෙ පත්තුවේ 479E බටපොත ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ රොබට් ගුණවර්ධන මාවතෙහි, වරිපනම් අංක 184 දරන "නාරංගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 2010 දෙසැම්බර් 2 වන දිනැති අංක 11372 දරන පිඹුරෙහි නිරූපණය කර ඇති ලොට් A ලෙස ලකුණු කොට බෙදා වෙන් කළ එකී ලොට් A: උතුරට රොබට් ගුණවර්ධන මාවත ද, නැගෙනහිරට ජී. සී. පෙරියප්පෙරුමගේ ඉඩම ද, දකුණට රොබට් ගුණවර්ධන මාවතේ වරිපනම් අංක 84/2 දරන පරිශ්‍රය සහ බලයලත් මිනින්දෝරු එස්. ධර්මවර්ධන විසින් සාදන ලද අංක 1364 දරන පිඹුරේ ලොට් 1 ද, බස්නාහිරට බලයලත් මිනින්දෝරු එස්. ධර්මවර්ධන විසින් සාදන ලද අංක 1364 දරන පිඹුරේ ලොට් 1 සහ රොබට් ගුණවර්ධන මාවතේ වරිපනම් අංක 186 දරන පරිශ්‍රය ද මායිම්ව එකී අංක 11372 දරන පිඹුර අනුව පර්චස් තිස් තුනයි දශම දෙකයි බින්දුවක (පර්.33.20) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියලු දේ සමඟ වේ. මෙම ඉඩම කඩුවෙල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 1438/30හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම පහත විස්තර කෙරෙන ඉඩමේ නැවත මිනුමක් වන අතර ඒකාබද්ධ කිරීමකි:

(1) එකී රොබට් ගුණවර්ධන මාවත වරිපනම් අංක 184/1 (කොටස) දරන "නාරංගහවත්ත" නමැති ඉඩමේ අංක 1364 දරන පිඹුරෙහි නිරූපණය කර ඇති ලොට් D ලෙස ලකුණු කොට බෙදා වෙන් කළ එකී ලොට් D: <u>උතුරට</u> රොබට් ගුණවර්ධන මාවත ද, <u>නැගෙනහිරට</u> අඩි පාර ද, <u>දකුණට</u> නලවත්තගේ ජෝර්ජ් පින්ටෝගේ ඉඩම,

වර්තමානයේ ඩී. ජී. සුමිත්‍රාආරච්චිගේ දේපළ ද, බස්නාහිරට ලොට් C ද මායිම්ව එකී අංක 1364 දරන පිඹුර අනුව පර්චස් විසි දෙකයි දශම දෙකයි පහක (පර්.22.25) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියලු දේ සමඟ වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 265/49හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම පහත විස්තර කෙරෙන ඉඩමේ නැවත මිනුමකි:

"නාරංගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. එන්. ජයවර්ධන විසින් සාදන ලද 1992.08.29 දිනැති අංක 444 දරන පිඹුරේ ලොට් 1 ලෙස සලකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 1: උතුරට රොබට් ගුණවර්ධන මාවත ද, නැගෙනහිරට අඩි 6ක් පළලැති අඩි පාර ද, දකුණට රොබට් ගුණවර්ධන මාවතේ වරිපනම් අංක 94/2 දරන විත්ටර් පෙරේරාගේ ඉඩම ද, බස්නාහිරට රොබට් ගුණවර්ධන මාවතේ වරිපනම් අංක 76 ද මායිම්ව පර්චස් විසි දෙකක (පර්.22) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියලු දේ සමඟ වේ.

(2) රොබට් ගුණවර්ධන මාවතේ වරිපනම් අංක 184A දරන "නාරංගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු සී. ද එස්. ගුණතිලක විසින් සාදන ලද 1997 අප්‍රේල් 23 දිනැති අංක 2584 දරන පිඹුරේ නිරූපණය කර ඇති ලොට් 2 ලෙස ලකුණු කොට බෙදා වෙන් කළ එකී ලොට් 2: උතුරට රොබට් ගුණවර්ධන මාවත ද, නැගෙනහිරට රොබට් ගුණවර්ධන මාවතේ වරිපනම් අංක 186 ද, දකුණට ලොට් 1 ද, බස්නාහිරට ලොට් 1 ද මායිම්ව එකී අංක 2584 දරන පිඹුර අනුව පර්චස් දහයක (පර්.10) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියලු දේ සමඟ වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1162/130හි ලියාපදිංචි කර ඇත.

1. ගෙවීම් කරන ආකාරය : වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් සිදු කළ යුතුය :

1.1 ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
1.2 වැට් (VAT) බදු අයකර ගැනීම් (අදාළ වේ නම්) ද,
1.3 විකුණුම් බද්ද ලෙස පළාත් පාලන අධිකාරියට 1% (සියයට එකක්) ද,
1.4 වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස 2.5% (සියයට දෙකයි දශම පහක්) ද,
1.5 විකුණුම් පිරිවැය සහ වෙනත් අයකර ගැනීම් වෙතොත් ඒ සැම,
1.6 වෙනත් ගාස්තු/අයකරගැනීම් ද,

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැනුම් මිලෙන් තවත් 10% (සියයට දහයක්) ද ගැනුම් මිලේ ඉතිරි 80% විකුණනු ලබන දිනයේ සිට මාස තුනක් ඇතුළත ද පියවිය යුතුය. ඊට අමතරව විකිණීමේ කොන්දේසි ගිවිසුම සහ විකුණුම් සහතික සඳහා මුද්දර බදු සහ නොතාරිස් ගාස්තු ද ගැනුම්කරු විසින් ගෙවිය යුතුය.

ඉහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට ගැනුම්කරු අපොහොසත් වන්නේ නම් වෙන්දේසි දිනයේදී ගෙවන ලද සියලු මුදල් බැංකුව සන්තකකිරීමේ සහ දේපළ නැවත වෙන්දේසිකිරීමේ අයිතිය බැංකුව සතුය.

2. දේපළට ප්‍රවේශ වන ආකාරය:

නව කොළඹ - නුවර මාර්ගයේ පන්නිපිටිය පාර හන්දියේ සිට නව කොළඹ - නුවර පාර ඔස්සේ කඩුවෙල දෙසට මීටර් 550ක් පමණ ගමන් කර රොබට් ගුණවර්ධන මාවත හන්දියට ළඟාවන්න. ඉන්පසු රොබට් ගුණවර්ධන මාවතට දකුණට හැරී මීටර් 600ක් පමණ ගමන් කර ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතට ළඟාවන්න. ඉන්පසු ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත හරහා ගොස් රොබට් ගුණවර්ධන මාවත ඔස්සේ මීටර් 400 ක් පමණ ගමන් කර තක්සේරු කළ යුතු දේපළට ළඟාවන්න. එය දකුණු පැත්තේ පිහිටා ඇති අතර මෙම මාර්ගයට මුහුණලා උතුරු සීමා මායිම පිහිටා ඇත. තවද, මෙම දේපළට නව කොළඹ - නුවර පාරේ කොස්වත්ත හන්දියේ සිට පාර්ලිමේන්තුව දෙසට මීටර් 550ක් පමණ ගමන් කර රොබට් ගුණවර්ධන මාවතට වමට හැරී ඉහත සඳහන් පරිදි ගමන් කිරීමෙන් ද ළඟා විය හැකිය. දේපළට යන මාර්ග වාහන ධාවනය කළ හැකි පොදු මාර්ග වේ.

ලංසුකරුවන්ට ඉහත සඳහන් දේපළට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන 0112 448632 යන දුරකථන අංකය ඔස්සේ ලංකා බැංකුවේ විශාඛා ශාඛාවේ කළමනාකරු හා සම්බන්ධ වී පරීක්ෂා කිරීමට නිදහස ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජේ. එම්. එස්. ජේ. වීරසිංහ,
කළමනාකරු,

ලංකා බැංකුව,
විශාඛා ශාඛාව.

02 - 202

ලංකා බැංකුව

වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන පනතින් සහ 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

1. ණය පහසුකම් යොමු අංක - 85539450, 85539560, 85539182 සහ 87841556

මරඳගහමුල, රන්ජ්ලැන්ඩ් වත්ත, අංක 342/01 හි ඩිල්ෂාන් තිවංක ප්‍රේමරත්න මහතාට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

2. ලංකා බැංකු ආඥාපනතේ 19 වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024.01.05 දින 2366 දරන *ගැසට් පත්‍රයේ* හා 2024.01.04 වන දින "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදීම 2026.03.09 දින පෙ.ව. 11.00 ට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර එම්.එච්.ටී. කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළයේ උතුර දූනගහ පත්තුවේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ උරපන බී අංක 86 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උරපන, කැලෑපිටිමුල්ල සහ මාපලන්ගෙදර ග්‍රාමයන් හි පිහිටි "රන්ජ්ලැන්ඩ් එස්ටේට්" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. විතාරණ විසින් සාදන ලද 1998 අගෝස්තු 05 දිනැති අංක 3248 දරන පිඹුරේ මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ඉඩමේ මායිම් නම්: උතුරට ඊබට් ෆොන්සේකා සහ ගුණතිලක ෆොන්සේකා හිමිකම් කියන ලොට් 137 ද, නැගෙනහිරට ක්ලීටස් ෆොන්සේකා සහ ගුණතිලක ෆොන්සේකා හිමිකම් කියන ලොට් 109 ද, දකුණට ප්‍රධාන පාර (ආර්.ඩී.ඒ.) ද, බස්නාහිරට ප්‍රාදේශීය සභා පාර ද මායිම්ව එකී අංක 3248 දරන පිඹුර අනුව රූඩ් එකක් (රූ.1) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J 25/62 හි ලියාපදිංචිකර ඇත.

1. ගෙවීම් කරන ආකාරය - වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් සිදු කළ යුතුය.
   1.1 ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
   1.2 වැට් (VAT) බදු අයකර ගැනීම් (අදාළ වේ නම්) ද,
   1.3 විකුණුම් බද්ද ලෙස පළාත් පාලන අධිකාරියට 1% (සියයට එකක්) ද,
   1.4 වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස 2.5% (සියයට දෙකයි දශම පහක්) ද,
   1.5 විකුණුම් පිරිවැය සහ වෙනත් අයකර ගැනීම් වෙතොත් ඒ සැම,
   1.6 වෙනත් ගාස්තු හා අයකර ගැනීම්ද,

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැනුම් මිලෙන් තවත් 10% (සියයට දහයක්) ද ගැනුම් මිලේ ඉතිරි 80% වෙන්දේසි දිනයේ සිට මාස තුනක් ඇතුළත ද පියවිය යුතුය. එයට අමතරව විකිණීමේ කොන්දේසි ගිවිසුම සහ විකුණුම් සහතික සඳහා මුද්දර බදු සහ නොතාරිස් ගාස්තු ද ගැනුම්කරු විසින් ගෙවිය යුතුය.

ඉහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට ගැනුම්කරු අපොහොසත් වන්නේ නම් වෙන්දේසි දිනයේදී ගෙවන ලද සියලු මුදල් බැංකුව සන්තක කිරීමේ සහ දේපළනැවත විකිණීමේ අයිතිය බැංකුව සතුය.

2. දේපළට ප්‍රවේශ වන ආකාරය:

කොළඹ සිට ජාඇල සහ මිනුවන්ගොඩ හරහා දිවුලපිටිය දක්වා කිලෝමීටර් 40 ක් පමණ ගොස් වම් පස ඇති මීගමුව පාරට පිවිස එහි කිලෝමීටර් 2ක් පමණ පැමිණ දකුණු පස ඇති දේපළ වෙත ළඟා විය හැකිය. එය නමින් දූලාජ් සේවා ස්ථානයයි.

ඉහත සඳහන් දේපළට අදාළ හිමිකම් ඔප්පු හා ඊට අදාළ වෙනත් ලේඛන 031 2246280 දුරකථන අංකයෙන් ලංකා බැංකුව දිවුලපිටිය ශාඛාවේ කළමනාකාරිණී හා සම්බන්ධ වී පරීක්ෂා කිරීමට ලංසුකරුවන්ට නිදහස ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්ලිව්.ඒ.ජී.ඩී. වරාගොඩ,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
දිවුලපිටිය ශාඛාව.

02 - 203

ලංකා බැංකුව

වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සහ 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

1. ණය යොමු අංකය 85236883.

කැකිරාව, පළුගස්වැව, දෙමුන්නැව හෝම් සීස් රයිස් මිල් හි රාජපක්ෂ කරුණානායක හේරත් බණ්ඩාරලාගේ උදයංගනී හේරත් මිය විසින් උකස් කරන ලද දේපළ විකිණීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයකට අනුකූලව සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024 ජනවාරි 05 දිනැති අංක 2366 දරන ගැසට් පත්‍රයේ හා 2024 ජනවාරි 04 දින දිනමිණ, තිනකරන් හා ඩේලිනිව්ස් යන පුවත්පත්වල පළකරන ලද දැන්වීම් අනුව මුල් ණය මුදලේ ශේෂය හා විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය එම ස්ථානයේ දී,

2026 අප්‍රේල් 10 සිකුරාදා දින පෙ.ව.11.30 ට,

කොළොන්නාව විහාර මාවත අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි බලයලත් වෙන්දේසිකාර එම්. එච්. ටී. කරුණාරත්න විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

පළමුවන උපලේඛනය

1. උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා කැකිරාව ප්‍රාදේශීය සභා සීමාවේ මාටඹුවා කෝරළයේ දෙමුන්නෑව අංක 594 දරන ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ (නමුත් දෙබුක්කෑව යනුවෙන් ලියාපදිංචි කර ඇති) දෙබුක්කෑව ග්‍රාමය ලෙස ලියාපදිංචි නමුත් දෙමුන්නෑව ග්‍රාමයේ පිහිටි "රජයේ ඉඩම" නමැති ඉඩම් කැබැල්ල උතුරට කේ.එම්. සෝමපාලගේ ඉඩම ද, නැගෙනහිරට ප්‍රධාන පාරේ වෙන්කිරීම් ද, දකුණට එම්. බී. ජයතිලකගේ ඉඩම ද, බස්නාහිරට දෙමුන්නෑව වැව් රක්ෂිතයට වෙන්කළ කොටස ද මායිම්ව අක්කර එකක් (අ.1) ක බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොළ වැවිලි, ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L.D.O.X. 05/42 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු කේ. වී. සෝමපාල විසින් සාදන ලද 2001.03.16 දිනැති අංක 3675 දරන මෑත මිනුම් පිඹුරට අනුව පහත සඳහන් පරිදි විස්තරෙකර ඇත.

එකී දෙමුන්නෑව ග්‍රාමයේ පිහිටි ස්ටේට් ලැන්ඩ් හෙවත් "ඉඩම" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු කේ. වී. සෝමපාල විසින් සාදන ලද 2001.03.16 දිනැති අංක 3675 දරන පිඹුරේ මායිම් නිරූපණය කළ ලොට් අංක 1 ලෙස ලකුණු කළ ඉඩම් කැබැල්ල එකී ලොට් 1 උතුරට කේ. එම්. සෝමපාලගේ ඉඩම් ද, නැගෙනහිරට පාර ද, දකුණට එම්. බී. ජයතිලකගේ ඉඩම ද, බස්නාහිරට දෙමුන්නෑව වැව් රක්ෂිතයට වෙන්කළ කොටස ද මායිම්ව අක්කර එකක් (අ.1,රූ.0,පර්.0) හෝ හෙක්ටයාර බිංදුවයි දශම හතරයි බිංදුවයි හතරයි හතක් (හෙක්.0.4047) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ.

දෙවන උපලේඛනය

වෙන්කිරීම්:

1. සියලු ඛනිජ (ඔප්පුවේ මෙම යෙදුමට වටිනා ගල් ද ඇතුළත් වේ.) පිළිබඳ හිමිකම සහ ඒවා හෑරීම, සෙවීම ඒ සමබන්ධව වැඩ කිරීම සහ එවැනි ඛනිජ බැහැර කිරීම යනාදි අයිතීන් රජය සතුය.

2. මෙම ඉඩමට අයිතිකරුවන් සතු හිමිකම වන්නේ මෙම ප්‍රදානයේ දිනයේ සිට පාරේ අයිතිය හා පවත්නා වෙනත් පරවශ්‍යතාවන්ට යටත්වයි.

කොන්දේසි.

1. අයිතිකරු විසින් ගොඩ ඉඩමෙන් මෙහි නිශ්චිතව දක්වා ඇති අක්කර 1/4 මඩ ඉඩමෙන් අක්කර/හෙක්ටයාර ---------- කට වඩා අඩු උප බෙදුම් ඒකකයක් බැහැර නොකළ යුතුය.

2 අයිතිකරු විසින් මෙහි ----- ලෙස නම් කොට නිශ්චිතව දක්වා ඇති ඉඩම් කොටසකට වඩා අඩු නොබෙදූ කොටසක් බැහැර නොකළ යුතුය.

3 කිසිවකුට ඉහත කොන්දේසි 1 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසකට අයිතිකරුවකු විය නොහැක.

4 කිසිවකුට ඉහත කොන්දේසි 2 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු අවම නොබෙදූ කොටසක අයිතිකරුවකු විය නොහැක.

5 ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රදේශය සම්බන්ධයෙන් අයිතිකරු වාරිමාර්ග ආඥාපනතේ (453 වගන්තිය) ඇති ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කළ යුතුය.

6 දිසාපතිගෙන් ලිඛිත අවසරයක් සහ අදාළ අධිකාරිගෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම ඉඩම මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛනිජ ද්‍රව්‍යයක් හෑරීම සෙවීම භාවිතයට ගැනීම විකිණීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම අයිතිකරු විසින් නොකළ යුතුය.

7 ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කොටසක් බැහැර නොකළ යුතුය.

1. ගෙවීම් ක්‍රමය : ගැනුම්කරු ලංසුව සාර්ථක වීමෙන් අනතුරුව පහත සඳහන් පරිදි මිළ ගණන් මුදලින් ගෙවිය යුතුය.

1.1 ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) එම අවස්ථාවේම ගෙවිය යුතුය,
1.2 වැට් බදු ගාස්තු,
1.3 විකුණුම් බදු වශයෙන් 1% ක (සියයට එකක්) බද්දක් පළාත් පාලන ආයතනය වෙත ගෙවිය යුතුය,
1.4 වෙන්දේසිකාර කොමිස් මුදල් හා අනෙකුත් ගාස්තු වශයෙන් 2.5% ක් (සියයට දෙකහමාරක්),
1.5 අදාළවේ නම් විකුණුම් වියදම් හා අනෙකුත් ගාස්තු
1.6 අනෙකුත් ගාස්තු හා වියදම්.

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් තුළ ගැනුම් මිලෙන් තවත් 10% (සියයට දහයක්) ගෙවිය යුතු අතර විකුණුම් දිනයේ සිට මාස තුනක් (03) ඇතුළත ගැනුම් මිලේ ඉතිරි 80% ගෙවිය යුතුය. මීට අමතරව ගැනුම්කරු මුද්දර ගාස්තු සහ විකුණුම් කොන්දේසි හා විකුණුම් සහතිකය සහතික කිරීමේ නොතාරිස් ගාස්තු ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කොන්දේසි හා ගැනුම්කරු එකඟවීමට අපොහොසත් වන්නේ නම් වෙන්දේසි දිනයේ ගෙවන ලද සියලුම මුදල් පවරා ගැනීමේ හා දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු ය.

ප්‍රවේශ මාර්ගය :-

කැකිරාව නගරයේ සිට නුවර පාරේ (ඒ 9) තිබ්බටුවැව නගරය දක්වා කි. මී 1. 5 ක් පමණ දුරක් ගමන් කර ඉලුකේගම පාරට වමට හැරී එම පාරේ වාරිමාර්ග ප්‍රධාන ඇළ දක්වා කි. මී 2.3 ක් පමණ ගමන් කර දකුණු අත පැත්තට හැරී කිලෝමීටර 3 ක් පමණ ගමන් කර වමට හැරී ඇළ පසු කර බෙල්ලන්කඩවල පාරේ කි. මී 6.5 ක් පමණ දුරක් ගමන් කරන්න. අදාළ දේපළ එම පාරේ වම් අත පැත්තේ පිහිටා ඇත. මෙම ඉඩම ''හෝම් සීස් රිසෝර්ට්'' යනුවෙන් ද හඳුන්වනු ඇත .

'ඉහත දේපළට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන ලංසුකරුවන්හට 2026 මාර්තු 23 දින සිට දු.ක. අංක 025 2264280/025 2264162 මගින් කැකිරාව ශාඛාවේ කළමණාකාරතුමිය ඇමතීමෙන් නිදහසේ පරීක්ෂා කළ හැක.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ.ආර්.එම්.සී.පී. කුමාරි,
කළමණාකාරිනි.

ලංකා බැංකුව,
කැකිරාව.

02 - 113

ලංකා බැංකුව

වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සහ 2000 අංක 54 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම.

1. ණය යොමු අංකය 84157068, 84157666.

තඹුත්තේගම, තිස්පනේපුර, අංක 14 හි වීරසූරිය ගලපිටගෙදර ජෝතිරත්න බණ්ඩාර මහතා විසින් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024 ජනවාරි 26 දිනැති අංක 2369 දරන *ගැසට් පත්‍රයේ* හා 2024 ජනවාරි 30 දින දිනමිණ, තිනකරන් හා ඩේලිනිව්ස් යන පුවත්පත්වල පළකරන ලද දැන්වීම් අනුව මුල් ණය මුදලේ ශේෂය හා විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය එම ස්ථානයේ දී 2026 මාර්තු 27 සිකුරාදා දින ප.ව.01.30 ට කොලොන්නාව විහාර මාවත අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි බලයලත් වෙන්දේසිකාර එම්. එච්. ටී. කරුණාරත්න විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

පළමුවන උපලේඛනය.

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා තලාව ප්‍රාදේශීය සභා සීමාවේ එප්පාවල කෝරළයේ තිස්පනේපුර අංක 428 ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ තිස්පනේපුර ග්‍රාමයේ පිහිටි ''රජයේ ඉඩම'' නමැති ඉඩම සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද එෆ්.සී.පී. 59 හි (ඉතා නිවැරදි ලෙස එෆ්.සී.පී.අ. 59) මායිම් නිරූපනය කළ ලොට් 278 ලෙස ලකුණු කළ ඉඩම් කැබැල්ල ; උතුරට :ලොට් අංක 292, 279 ද, නැගෙනහිරට : ලොට් අංක 279, 275 ද, දකුණට : ලොට් අංක 275, 277 ද, බස්නාහිරට :ලොට් අංක 277, 292 ද මායිම්ව හෙක්ටෙයාර බිංදුවයි දශම දෙකයි හතරයි හයක් (හෙක්. 0.246) ක බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහ කොළ වැවිලි ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/P/07/95 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු එස්. බාලේන්දිරන් විසින් සාදන ලද 2008.05.21 දිනැති අංක 2008/41 දරන මෑත මිනුම් පිඹුරට අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත :

එකී තිස්පනේපුර ග්‍රාමයේ පිහිටි "කුඹුක්වැව කැලේ" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එස්. බාලේන්දිරන් විසින් සාදන ලද 2008.05.21 දිනැති අංක 2008/41 දරන පිඹුරේ මායිම් නිරූපනය කළ ලොට් A ලෙස ලකුණු කළ ඉඩම් කැබැල්ල, උතුරට : එෆ්. සී.පී.අ. 59 හි අංක 292 සහ 279 ද , නැගෙනහිරට : එෆ්.සී.පී.අ 59 හි ලොට් අංක 279 සහ 275 ද , දකුණට : එෆ්.සී.පී.අ. 59 හි ලොට් අංක 275 සහ 277 ද, බස්නාහිරට : එෆ්.සී.පී.අ. 59 හි ලොට් අංක 277 සහ 292 ද මායිම්ව හෙක්ටෙයාර බිංදුවයි දශම දෙකයි හතරයි හයක් (හෙක් 0.246) ක් හෝ රූඩ් දෙකයි පර්චස් දාහතයි දශම දෙකයි හයක් (අ.0, රූ.2, ප.17.26) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහ කොළ වැවිලි ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ.

දෙවන උපලේඛනය

වෙන්කිරීම් :-

1. සියලු ඛනිජ (ඔප්පුවේ "මෙම" යෙදුමට වටිනා ගල් ද ඇතුළත්වේ.) පිළිබඳ හිමිකම සහ ඒවා හෑරීම සෙවීම ඒ සම්බන්ධව වැඩ කිරීම සහ එවැනි ඛනිජ බැහැර කිරීම යනාදී අයිතීන් රජය සතුය.

2. මෙම ඉඩමට අයිතිකරුවන් සතු හිමිකම වන්නේ මෙම ප්‍රදානයේ දිනයේ සිට පාරේ අයිතිය හා පවත්නා වෙනත් පරවශ්‍යතාවන්ට යටත්වයි.

කොන්දේසි.

1. අයිතිකරු විසින් ගොඩ ඉඩමෙන් මෙහි නිශ්චිතව දක්වා ඇති හෙක්ටෙයාර 0.101 ක්, මඩ ඉඩමෙන් අක්කර/හෙක්ටෙයාර ---------- කට වඩා අඩු උප බෙදුම් ඒකකයක් බැහැර නොකළ යුතුය .

2. අයිතිකරු විසින් මෙහි අක්කර 1/2 ලෙස නම් කොට නිශ්චිතව දක්වා ඇති ඉඩම් කොටසකට වඩා අඩු නොබෙදූ කොටසක් බැහැර නොකළ යුතුය.

3. කිසිවකුට ඉහත කොන්දේසි 1 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසකට අයිතිකරුවකු විය නොහැක.

4. කිසිවකුට ඉහත කොන්දේසි 2 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු අවම නොබෙදූ කොටසක අයිතිකරුවකු විය නොහැක.

5. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරි මාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රදේශය සම්බන්ධයෙන් අයිතිකරු වාරිමාර්ග ආඥාපනතේ (453 වගන්තිය) ඇති ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කළ යුතුය.

6. දිසාපතිගෙන් ලිඛිත අවසරයක් සහ අදාළ අධිකාරිගෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම ඉඩම මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛනිජ ද්‍රව්‍යයක් හෑරීම, සෙවීම, භාවිතයට ගැනීම, විකිණීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම අයිතිකරු විසින් නොකළ යුතුය.

7. ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කොටසක් බැහැර නොකළ යුතුය.

තුන්වන උපලේඛනය.

ඉහත පළමුවන උපලේඛනයේ විස්තර කළ ඉඩමට හා පරිශ්‍රයට සවිකර ඇති යන්ත්‍ර සූත්‍ර අමතර කොටස් සමග පහත සඳහන් දේවලින් සමන්විත වේ.

	Description	Quantity	Country
1	Paddy Drier 10,000 kg (Rs. 1,500,000/-)	1	
2	Boiler 40' x 12' (Rs. 500,000/-)	1	
3	Steam boiler, 2nd hand	1	Indian
4	Box Boiler (07 Years)	1	Local
5	Paddy steam tanks (250kg) (07 years)	3	Local
6	Huller (08 years)	1	Chaina
7	Polisher (20 hp) (09 Years)	1	Chaina
8	Polisher (25 hp) (07 Years)	1	Chaina
9	Separator (07 Years)	1	Local
10	Stoner (09 Years)	1	India
11	Dust fan (07 Years)	1	Local
12	Blower (08 Years)	1	Local
13	Flour Grinder (07 Years)	1	India
14	Husk fan (07 Years)	1	Local
15	Elevator (07 Years)	5	Local

1. ගෙවීම් ක්‍රමය: ගැනුම්කරු ලංසුව සාර්ථකවීමෙන් අනතුරුව පහත සඳහන් පරිදි මිල ගණන් මුදලින් ගෙවිය යුතු ය :-

1.1 ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) එම අවස්ථාවේම ගෙවිය යුතුය ;
1.2 වැට් බදු ගාස්තු ;
1.3 විකුණුම් බදු වශයෙන් සියයට එකක් (1%) බද්දක් පළාත් පාලන ආයතනය වෙත ගෙවිය යුතු ය ;
1.4 වෙන්දේසිකාර කොමිස් මුදල් හා අනෙකුත් ගාස්තු වශයෙන් සියයට දෙකහමාරක් (2.5%) ;
1.5 අදාළවේ නම් විකුණුම් වියදම් හා අනෙකුත් ගාස්තු ;
1.6 අනෙකුත් ගාස්තු හා වියදම්.

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් තුළ ගැනුම් මිලෙන් තවත් සියයට දහයක් (10%) ගෙවිය යුතු අතර විකුණුම් දිනයේ සිට මාස තුනක්

(03) ඇතුළත ගැනුම් මිලේ ඉතිරි 80% ගෙවිය යුතුය. මීට අමතරව ගැනුම්කරු මුද්දර ගාස්තු සහ විකුණුම් කොන්දේසි හා විකුණුම් සහතිකය සහතික කිරීමේ නොතාරිස් ගාස්තු ගෙවිය යුතුය.

ඉහත සඳහන් කොන්දේසි හා ගැනුම්කරු එකඟවීමට අපොහොසත් වන්නේ නම් වෙන්දේසි දිනයේ ගෙවන ලද සියලුම මුදල් පවරාගැනීමේ හා දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුය.

2. දේපළ වෙත ප්‍රවේශ මාර්ගය :-

තඹුත්තේගම රැජින හන්දියේ සිට ගල්නැව පාරේ තිස්පනේපුර හන්දිය දක්වා කිලෝමීටර 4.4 ක් පමණ දුරක් ගමන් කර කොන්ක්‍රීට් පාරට වමට හැරී මීටර 60 ක් පමණ ගමන් කළ විට පාරට මුහුණලා දකුණු අත පැත්තේ දේපළ පිහිටා ඇත.

"ඉහත දේපළට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන ලංසුකරුවන් හට 2026 මාර්තු 13 දින සිට දුරකථන අංක 025 2275130/025 2276280 මගින් තඹුත්තේගම ශාඛා කළමණාකරු ඇමතීමෙන් නිදහසේ පරීක්ෂා කළ හැක".

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බී.කේ.ආර්.බුද්ධදාස,
කළමණාකරු.

ලංකා බැංකුව,
තඹුත්තේගම.

02 - 114